Please check the examination details below before entering your candidate information

| Candidate surname | Other names |
|---|---|
| | |

**Pearson Edexcel International GCSE (9–1)**

Centre Number

Candidate Number

# Thursday 21 May 2020

Morning (Time: 2 hours 30 minutes) | Paper Reference **4SI1/01**

# Sinhala

## Paper 1: Reading, Writing and Translation

**You do not need any other materials.**

Total Marks

## Instructions

- Use **black** ink or ball-point pen.
- **Fill in the boxes** at the top of this page with your name, centre number and candidate number.
- There are **three** sections you must answer:
  – Section A Questions 1–4
  – Section B Question 5 and **either** Question 6(a) **or** 6(b) **or** 6(c)
  – Section C Question 7.
- Answer the questions in the spaces provided
  *– there may be more space than you need.*
- You must **not** use a dictionary.

## Information

- The total mark for this paper is 100.
- The marks for **each** question are shown in brackets
  *– use this as a guide as to how much time to spend on each question.*

## Advice

- Read each question carefully before you start to answer it.
- Check your answers if you have time at the end.

*Turn over* ▶

P63959A
©2020 Pearson Education Ltd.
1/1/1/1/

P 6 3 9 5 9 A 0 1 2 0

Pearson

## SECTION A: READING

**Answer ALL questions.**

**Write your answers in the spaces provided.**

**Multiple-choice questions must be answered with a cross in a box ☒. If you change your mind about an answer, put a line through the box ☒ and then mark your new answer with a cross ☒. Open-response questions do not have to be written in full sentences and you may respond using single words or phrases.**

**1** පහත සඳහන් පාඨය කියවා, එම තොරතුරුවලට අනුව දී ඇති සිංහල වාක්‍යවල හිස් තැන් පුරවන්න. කොටුව තුළ නිවැරදි අක්ෂරය ලියන්න.

### යාල ජාතික වනෝද්‍යානය

ඉන්දියානු සාගරයට මායිම්ව පිහිටි යාල ජාතික වනෝද්‍යානය ශ්‍රී ලංකාවේ දෙවැනි විශාලතම වනෝද්‍යානයයි. මෙම වනෝද්‍යානය ඒකක පහකට බෙදා ඇති අතර ඉන් යාබදව පිහිටි ඒකක දෙකක් නරඹන්නන්ට විවෘතව පවතියි. ඒවා රුහුණ සහ කුමන ජාතික වනෝද්‍යාන වශයෙන් නම් කර ඇත. කුමන වනෝද්‍යානය 'යාල නැගෙනහිර' වශයෙන් ද හැඳින් වේ.

යාල වනෝද්‍යානය රටේ ගිනිකොන දිශාවෙහි පිහිටා ඇති අතර එය දකුණු සහ ඌව පළාත් දෙකෙහිම ව්‍යාප්තව පවතියි. මෙම වනෝද්‍යානය සතු පරිසර පද්ධති විවිධත්වය නිසා එය රටේ වැඩිම පිරිසක් නරඹා ඇති උද්‍යානය බවට වාර්තා වී තිබේ. වර්ග කි.මී. 979ක් වන මෙම වනෝද්‍යානය කොළඹ සිට කි.මී. 300ක් පමණ දුරින් පිහිටා ඇත. වර්ෂ 1900 දී යාලත් 1938 දී විල්පත්තුවත් ශ්‍රී ලංකාවේ පළමු වනජීවී අභය භූමි දෙක ලෙස නම් කරන ලදී. යාල වනෝද්‍යානය වන සත්ත්ව විවිධත්වය අතින් වඩාත් ප්‍රකටය. එය අලි, දිවි හා ජලචර පක්ෂීන්ගේ සංරක්ෂණය සඳහා වැදගත් වෙයි.

යාල පෙනෙන මානයේ තවත් ජාතික වනෝද්‍යාන හයක් හා වනජීවී අභය භූමි තුනක් පිහිටා ඇත. ඉන් විශාලතම අභය භූමිය වන්නේ ලුණුගම්වෙහෙර ජාතික වනෝද්‍යානයයි.

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

| | | | |
|---|---|---|---|
| **A** යාල | **B** ගිනිකොන | **C** නරඹන්නන්ට | **D** ජලජ ජීවීන්ට |
| **E** අභය භූමියක් | **F** කි.මී. 979 | **G** යාල නැගෙනහිර | **H** කුමන |
| **I** ඉන්දියානු සාගරයට | **J** වනෝද්‍යාන | **K** පරිසර පද්ධති | **L** කි.මී. 300 |
| **M** වන සතුන්ට | | | |

| | | |
|---|---|---|
| උදාහරණ: | ......... ශ්‍රී ලංකාවේ දෙවැනි විශාලතම වනෝද්‍යානයයි. | *A* |
| **1** (a) | යාල වනෝද්‍යානය ......... යාව පිහිටා ඇත. | |
| **1** (b) | කුමනට ......... යැයි ද කියති. | |
| **1** (c) | යාල වනෝද්‍යානය තුළ ......... රාශියක් ඇත. | |
| **1** (d) | කොළඹ සිට යාලට ඇති දුර ......... කි. | |
| **1** (e) | 1938 දී විල්පත්තුව ......... ලෙස නම් කෙරිණි. | |
| **1** (f) | යාල වනෝද්‍යානය ......... වාසස්ථානයකි. | |

**(Total for Question 1 = 6 marks)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**2** ශ්‍රී ලංකාවේ කර්මාන්ත ගැන මෙම පාසල් ළමුන් තිදෙනාගේ අදහස් කියවා පහත වගුව පුරවන්න. නිවැරදි කොටු 8 තුළ එක් කතිරය බැගින් යොදන්න. ඇතැම් වාක්‍යයකට හෝ පුද්ගලයෙකුට කතිර එකකට වඩා තිබිය හැකි අතර ඇතැම් විට එකක්වත් නොතිබිය හැකිය.

## ශ්‍රී ලංකාවේ කර්මාන්ත

වික්ටර්



මධ්‍යම කඳුකරයේ හා පහත රට තැනි බිම්වල කෙරෙන කෘෂිකර්මාන්තය ශ්‍රී ලංකාවේ වැදගත් කර්මාන්තයකි. තේ වගාව සාමාන්‍යයෙන් කෘෂිකර්මාන්තයක් ලෙස නොසලකන අතර එය ප්‍රධාන වශයෙන්ම අපනයනය සඳහා නිපදවන වාණිජ බෝගයක් ලෙස පිළිගැනේ. මෑත කාලයේ ඉතා වේගයෙන් ඇඟළුම් කර්මාන්තය ව්‍යාප්ත වුවත් ඝර්ම කලාපීය සරු පොළොව හා වැඩි දියුණු කළ ඵලදායිතාව නිසා අදටත් කෘෂිකර්මාන්තය රටේ ප්‍රධානතම කර්මාන්තයයි.

කුමාරි



රටට විශාල විදේශ විනිමයක් ගෙනෙන ඇඟළුම් කර්මාන්තය ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයනවලින් එකකි. මෙම කර්මාන්තය නිසා ප්‍රධාන වශයෙන්ම ග්‍රාමීය හා නාගරික තරුණ තරුණියන්ට රැකියා අවස්ථා උදා වී තිබේ. මෙරට රෙදි පිළි නිෂ්පාදනයෙන් කොටසක් දේශීය වශයෙන් අළෙවි කෙරන අතර තවත් කොටසක් එක්සත් ජනපදයට හා යුරෝපීය රටවලට අපනයනය කෙරෙයි. 2017 වර්ෂයේ දී සමස්ත ඇඟළුම් නිෂ්පාදනයෙන් 44% ක් අපනයනය කළ බව වාර්තා වේ.

පියල්



තේ වගා කිරීම ශ්‍රී ලංකාවේ ප්‍රධාන රක්ෂාවලින් එකකි. 2018 වර්ෂයේ දී ශ්‍රී ලංකාව ලෝක තේ අපනයනයෙන් 23% ක් නිෂ්පාදනය කිරීමට සමත් විය. මධ්‍යම කඳුකරයට ලැබෙන වාර්ෂික වර්ෂාපතනය හා එහි ඇති ආර්ද්‍රතා මට්ටම නිසා මෙම දිවයින තේ වගා කිරීම සඳහා ඉතා උචිත ස්ථානයක් වී තිබේ. එක්සත් රාජධානිය ඇතුළු ලොව අනෙකුත් රටවලට හොඳම සන්නම් සහිත තේ අපනයනය කරන රට බවට මෑතකදී ශ්‍රී ලංකාව නම් කෙරිණි. තේ කර්මාන්තය ග්‍රාමීය දිළිඳු භාවය අවම කිරීමට ද උපකාර වේ.

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA



P63959A0420

| | | වික්ටර් | කුමාරි | පියල් |
|---|---|---|---|---|
| උදාහරණ: | කෘෂිකර්මාන්තය ගැන කියයි. | ☒ | ☐ | ☐ |
| **A** | තේ වගාව ගැන පවසයි. | ☐ | ☐ | ☐ |
| **B** | නිළ ඇඳුම් ගැන කථා කරයි. | ☐ | ☐ | ☐ |
| **C** | ප්‍රතිශතයක් ලෙස දක්වයි. | ☐ | ☐ | ☐ |
| **D** | ඇමරිකාව ගැන සඳහන් කරයි. | ☐ | ☐ | ☐ |
| **E** | ඇගළුම් ගැන සාකච්ඡා කරයි. | ☐ | ☐ | ☐ |
| **F** | මහා බ්‍රිතාන්‍යය ගැන කියයි. | ☐ | ☐ | ☐ |

**(Total for Question 2 = 8 marks)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**3** **කුමාරතුංග මුනිදාස** මහතා පිළිබඳ පහත ලිපිය කියවන්න. **සිංහල** වචන යොදා පහතින් දී ඇති වාක්‍යවල හිස් තැන් පුරවන්න.

කුමාරතුංග මුනිදාස

සිංහල ලේඛන කලාවේ පුරෝගාමියෙකු වූ කුමාරතුංග මුනිදාස මහතා 1887 වර්ෂයේ ජූලි මස 25 වෙනි දින රුහුණේ දික්වැල්ලේ උපත ලැබීය. කුඩා කල සිටම සාහිත්‍යයට දැඩි ඇල්මක් දැක්වූ එතුමා වෘත්තියෙන් ගුරුවරයෙකු විය. නිර්මාණශීලී ලේඛකයෙකු හා විශිෂ්ට අධ්‍යාපනඥයෙකු වශයෙන් එතුමාගෙන් සිංහල භාෂාවටත් ජාතියටත් සිදු වූ සේවය අපමණය. තවද, ප්‍රකට වාග් විශේෂඥයෙකු වූ එතුමා "හෙළ හවුල" නම් සංවිධානය පිහිටුවා එමගින් සිංහල භාෂාව තුළ අරක් ගෙන තිබුණු සංස්කෘත බලපෑම ඉවත් කිරීමට මහත් වෙහෙසක් දැරීය.

කුමාරතුංග මුනිදාස මහතා සාහිත්‍ය ලෝකයේ අසහාය චරිතයක් වූයේ එතුමා තුළ පැවති අසාමාන්‍ය භාෂා ඥානයත් නිර්මාණශීලී චින්තනයත් නිසාය. සිංහල, පාලි හා සංස්කෘත භාෂා පිළිබඳ හසල දැනුමක් ලබා සිටි එතුමා දමිළ, මලයාළම්, ඉංග්‍රීසි, ලතින් හා ග්‍රීක යන භාෂා ද දක්ෂ ලෙස හසුරුවන්නට සමත් විය.

බ්‍රිතාන්‍ය බලපෑම හේතුවෙන් 19 වන ශත වර්ෂයේ මුල් භාගයේ සිටම සිංහල භාෂාවේ පිරිහීමක් දක්නට ලැබුණි. කුමාරතුංග මුනිදාස මහතා එකල සිටි බොහෝ ලේඛකයන් හා එක්ව සිංහල භාෂාවේ උන්නතියට වැඩ කටයුතු රාශියක් කළ අතර, පර්යේෂකයෙකු වූ එතුමා ශ්‍රී ලංකාවටම ආවේණික සංගීත ශෛලියක් සකසා ගැනීමට පර්යේෂණ සිදු කළේය.

කුමාරතුංග මුනිදාස මහතා සිංහල භාෂාව සහ සාහිත්‍ය ක්ෂේත්‍රයේ පතාක යෝධයෙකු බව එතුමාගේ කෘති පරිශීලනය කරන විට පෙනේ. අදත් ළමුන් අතර ඉතා ජනප්‍රිය "ශික්ෂා මාර්ගය" කුමාරතුංග මුනිදාස මහතා විසින් රචිත අනර්ඝ කෘතියකි.



P 6 3 9 5 9 A 0 6 2 0

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

උදාහරණ: කුමාරතුංග මුනිදාස මහතා ලේඛන කලාවේ ප්‍රමුඛයෙකු වශයෙන් ප්‍රසිද්ධය.

(a) කුමාරතුංග මුනිදාස සූරීන් උපන්නේ .................................................... වර්ෂයේ ය. **(1)**

(b) කුමාරතුංග මුනිදාස මහතා ළමා කාලයේ පටන් .................................................... දැඩි ඇල්මක් දැක්විය. **(1)**

(c) හෙළ හවුල බිහි වූයේ සිංහල භාෂාවේ .................................................... ඉවත් කිරීමටය. **(1)**

(d) කුමාරතුංග මුනිදාස මහතා .................................................... හා .................................................... හේතුවෙන් සාහිත්‍ය ලොවේ සුවිශේෂ පුද්ගලයෙක් විය. **(2)**

(e) හෙළ බසට අමතරව ඔහු .................................................... හා .................................................... ද මනාව දැන සිටියේය. **(2)**

(f) කුමාරතුංග මුනිදාස මහතා භාෂා .................................................... පමණ දැන සිටි බව මෙහි කියැවේ. **(1)**

(g) සිංහල භාෂාව පරිහානියට ලක් වූයේ .................................................... නිසාය. **(1)**

(h) එතුමා සිංහල භාෂාවේ .................................................... දායක වූ අතර අපටම අනන්‍ය .................................................... සොයා ගැනීමට පර්යේෂණ කළේය. **(2)**

(i) .................................................... කුමාරතුංග මුනිදාස මහතා ලියූ වටිනා ග්‍රන්ථයකි. **(1)**

**(Total for Question 3 = 12 marks)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**4** නිමල් බණ්ඩාර මහතා විසින් රචිත නෙල්ලි කැලේ වීරයෝ කෘතියෙන් උපුටා ගන්නා ලද පහත සඳහන් ඡේදය කියවන්න.

## බාලදක්ෂ ව්‍යාපාරය

බාලදක්ෂ ව්‍යාපාරය ගැන සඳහන් දර්ශනීය පෝස්ටරයක් විද්‍යාලයේ දැන්වීම් පුවරුවේ අලවා තිබුණි. බාලදක්ෂයන් කීප දෙනෙකු එකතු වී වැඩ කරන අයුරු එම පෝස්ටරයෙන් දිස්වුණි. සුනිල්ගේ සිත ඇදී ගියේ ඔවුන් පැළඳගෙන සිටි හිස්වැසුම කෙරෙහිය. ප්‍රියන්ත හා කමල් ඔවුන්ගේ ඇඳුමෙහි ඇති අලංකාරය ගැන කථා කරනු ඇසිණි. ඉන් පසු ඔවුහු පුවරුවේ තිබූ දැන්වීම කියවන්නට වූහ.

"ලෝකයේ ඇති විශාලතම ළමා හා තරුණ සංවිධානය බාලදක්ෂ ව්‍යාපාරයයි. රටවල් 152ක් පුරා ව්‍යාප්ත වුණු සාමාජිකයන් එක්කෝටි අනූ ලක්ෂයක් පමණ සාමාජිකත්වය දරන බාලදක්ෂ ව්‍යාපාරයට ජාති ආගම් ආදි බේදවලින් තොර ඉතා දිගු ඉතිහාසයක් හිමිව තිබේ. ශ්‍රී ලංකාවේ විශාලතම ළමා හා තරුණ සංවිධානය ද බාලදක්ෂ ව්‍යාපාරය වේ. වසර 88ක් පමණ ශ්‍රී ලංකාවේ ළමා පරපුරේ අභිවෘද්ධියට බාලදක්ෂ ව්‍යාපාරයෙන් සිදු වූ මෙහෙය සුළු පටු නොවේ. එබැවින් විද්‍යාලවල බාලදක්ෂ කණ්ඩායම් ආරම්භ කිරීමටත් ඒවාට අලුතින් සාමාජිකයන් බඳවා ගැනීමටත් අදහස් කර තිබේ. රට දැය වෙනුවෙන් කැප වුණු බාලදක්ෂ ව්‍යාපාරයට හවුල් වී ඔබත් රට දැය සුරකින උදාර දරුවෙකු වන්න."

මීට

දිසා බාලදක්ෂ කොමසාරිස්

බාලදක්ෂයන් සමාජයේ සිටින සෑම කෙනෙකුගේම ආදරය ලබන වීර ළමා පිරිසකි. ඔවුහු රට දැය වෙනුවෙන්ම කැප වී වැඩ කිරීමට බැඳී සිටිති. පදක්කම් පැළඳ වීමේ උත්සව, කඳවුරුවලට සහභාගි වීම ආදී ඡායාරූප පුවත්පත්වල දුටු විට 'මටත් බාලදක්ෂයෙකු වීමට ඇත්නම්' යන අදහස මේ මිතුරන් තිදෙනා තුළම තිබුණි. ඒ සඳහා ඔවුන්ට දැන් අවස්ථාවක් ලැබී තිබේ. මුලින් කමල් ටිකක් අදිමදි කළත් සුනිල් හා ප්‍රියන්ත ඊට උඩින්ම කැමති විය. උදෑසන පාසල ආරම්භයේ දී පවත්වන රැස්වීමේ දී විදුහල්පතිතුමා ද බාලදක්ෂ ව්‍යාපාරය පිළිබඳව දරුවන්ට අවබෝධයක් ලැබෙන පරිදි කථා කළේය.

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

**4** (a) පාඨයේ ඇති තොරතුරු අනුව අසා ඇති ප්‍රශ්නවලට **සිංහලෙන්** පිළිතුරු සපයන්න.
පිළිතුරු සඳහා සම්පූර්ණ වාක්‍ය ලිවීම අවශ්‍ය නොවේ.

(i) මෙම පෝස්ටරය කුමක් ගැනද?

**(1)**

..............................................................................................................................................

(ii) එහි දක්නට ලැබුණේ කිනම් දසුනක්ද?

**(1)**

..............................................................................................................................................

(iii) සුනිල්ගේ හා ඔහුගේ මිතුරන් දෙදෙනාගේ සිත්ගත් කරුණු දෙක ලියන්න?

**(2)**

..............................................................................................................................................

..............................................................................................................................................

(iv) ලොව පුරා ඇති මෙම ව්‍යාපාරයේ සාමාජික සංඛ්‍යාව කොතෙක්ද?

**(1)**

..............................................................................................................................................

(v) මෙම ව්‍යාපාරය සතු වෙසෙස් ගුණාංගය කුමක්ද?

**(1)**

..............................................................................................................................................

(vi) මෙම දැන්වීම පළ කිරීමේ අරමුණු දෙක ලියන්න.

**(2)**

..............................................................................................................................................

..............................................................................................................................................

(vii) ජනතාව බාලදක්ෂයන්ටත් බාලදක්ෂයන් රටටත් දක්වන ආකල්ප දෙක නම් කරන්න.

**(2)**

..............................................................................................................................................

..............................................................................................................................................

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**4** (b) පාසල් විෂය නිර්දේශයට අදාළ විෂය බාහිර ක්‍රියාකාරකම් පිළිබඳව මෙම සිසුන් දෙදෙනා කරන සංවාදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **සිංහලෙන්** පිළිතුරු සපයන්න.

ගණේෂ්
ශ්‍රී ලංකාවේ පාසල්වල ප්‍රධාන විෂය ධාරාව හා විෂය බාහිර ක්‍රියාකාරකම් යන දෙකම උගන්වනවා. විෂය බාහිර ක්‍රියාකාරකම් යනුවෙන් හඳුන්වන්නේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් තම ශාස්ත්‍රීය අධ්‍යයන කටයුතුවලට අමතරව සිදු කරන වෙනත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් වේ. නිසි අධ්‍යාපනයක් ලැබීමට නම් ළමුන් විෂය බාහිර ක්‍රියාකාරකම්වල නිරත වීම අනිවාර්යයි. පොත පතින් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලබා දෙන දැනුම විෂය බාහිර ක්‍රියාකාරකම් මගින් තව දුරටත් රසවත්ව හා සිත් කාවදින සුලු ආකාරයෙන් කියා දිය හැකියි. මෙමගින් ඔවුන්ට තම සහජ දක්ෂතා හා විවිධ හැකියා එළි දැක්වීමට මහඟු අවස්ථා රාශියක් උදා වෙනවා. එමෙන්ම එය ඔවුන්ගේ එකී දක්ෂතා වැඩි දියුණු කර ගැනීමට ද උපකාර වෙනවා.

ක්‍රීඩා, ගෙවතු වගා හා පාසල් ක්ෂේත්‍ර චාරිකා ආදිය පාසල් තුළ ක්‍රියාත්මක වන විෂය බාහිර ක්‍රියාකාරකම්වලින් කිහිපයක් ලෙස දැක්විය හැකියි. පාසල් කාලයේත්, පාසල හමාර වීමෙන් පසුවත්, ළමුන් පුරුදු පුහුණු වන විෂය බාහිර ක්‍රියාකාරකම්වලින් ළමයින්ට ලබා ගත හැකි ප්‍රයෝජන අමුතුවෙන් විස්තර කළ යුතු යැයි මා සිතන්නේ නැහැ. මෙම ක්‍රියාකාරකම්වල නියැලීමෙන් සාමූහිකව වැඩ කිරීමේ පුරුද්ද, විනය ගරුක බව හා ඉවසීම වැනි ගුණධර්ම බොහොමයක් ඉගෙන ගන්න පුළුවන්. තවද, ගෙවතු වගාව වැනි ක්‍රියාකාරකමක් ඉගෙනීමෙන් කෘෂිකර්මාන්තය, සෞඛ්‍ය සම්පන්න ආහාර රටා සහ විවිධ පැළෑටි වර්ග ගැන දැන ගන්න පුළුවන්.

මොහම්මඩ්
ළමයෙකුගේ පෞරුෂ සංවර්ධනය කෙරෙහි විෂය බාහිර ක්‍රියාකාරකම්වලට යම් බලපෑමක් ඇති කළ හැකි වුවත් ඇතැම් ශිෂ්‍ය ශිෂ්‍යාවන් උනන්දු වන්නේ ශාස්ත්‍රීය අධ්‍යාපනය ලැබීමට පමණක් නම් ඔවුන්ව බලහත්කාරයෙන් බාහිර ක්‍රියාකාරකම්වල යෙදවිය යුතු නැහැ. ඇරත්, විෂය බාහිර ක්‍රියාකාරකම් ප්‍රධාන විෂය ධාරාවට ගැනෙන්නේ නැහැ.

විෂය බාහිර ක්‍රියාකාරකම්වල යෙදීම සඳහා ළමුන්ට විශාල මුදලක් හා කාලයක් වැය කරන්න සිදු වෙනවා. එමෙන්ම පාසල් කාලය තුළත් පාසල ඇරුණු පසුත් විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා ළමුන් වැය කරන එම කාලය ඔවුන්ට වැදගත් විෂය කරුණු ඉගෙනීම සඳහා යොදවන්නට හැකියි. විෂය බාහිර ක්‍රියාකාරකම් කිරීමට නාස්ති කරන එම කාලය ඉහළ සාමාර්ථ ලබා ගැනීම සඳහා පාඩම් වැඩවලට යෙදවීමෙන් ඔවුන්ට මෙම තරඟකාරී ලෝකයේ සාර්ථක ජීවිත ගත කළ හැකියි.

(i) පළමු කථිකයාගේ අදහස් සාරාංශ කරන්න

- විෂය බාහිර ක්‍රියාකාරකම් යනු: **(1)**
- විෂය බාහිර ක්‍රියාකාරකම්වලින් ළමුන්ට ඇති වාසි: **(1)**

.......................................................................................................................................................

.......................................................................................................................................................

(ii) දෙවන කථිකයාගේ අදහස් සාරාංශ කරන්න

- විෂය බාහිර ක්‍රියාකාරකම්වලට හිමි තැන: **(1)**
- විෂය බාහිර ක්‍රියාකාරකම්වල ඇති අවාසි: **(1)**

.......................................................................................................................................................

.......................................................................................................................................................

**(Total for Question 4 = 14 marks)**

**TOTAL FOR SECTION A = 40 MARKS**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**SECTION B: WRITING**

Answer Question 5 and **either** Question 6(a) **or** 6(b) **or** 6(c).

**Write your answers in the spaces provided.**

**5**

සාප්පු සවාරියක්

සාම්ප්‍රදායික සාප්පු සවාරි ක්‍රම

නූතන සාප්පු සවාරි ක්‍රම

මෑතකදී ඔබ ගිය සාප්පු සවාරියක්

ඔබ යන මීළඟ සාප්පු සවාරිය

වචන 85ක් පමණ භාවිත කරමින් සාප්පු සවාරි ගැන **සිංහල** වාක්‍ය රචනයක් ලියන්න. ඉහත සඳහන් වචන සියල්ලම භාවිත කළ යුතුයි.

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**(Total for Question 5 = 14 marks)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**6** පහත සඳහන් මාතෘකා තුනෙන් එකක් තෝරාගෙන වචන 145ක පමණ වාක්‍ය රචනයක් සිංහලෙන් ලියන්න. ඔබ තෝරාගත් විකල්පයට සරිලන ආකාරයෙන් පිළිතුරු ලිවිය යුතුය.

**පළමු විකල්පය**

(a)



ක්ෂණික ආහාර පිළිබඳ ඔබේ අදහස් ගෙනහැර දක්වමින් පාසලේ සෞඛ්‍ය විද්‍යා සංගමයේ ගරු සභාපති ලෙස ඔබ පවත්වන කථාව ලියන්න. ඔබේ කථාවේ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතුය.

- ක්ෂණික ආහාර වර්ග සෞඛ්‍යය කෙරෙහි බලපාන අයුරු
- පසුගිය දශකය තුළ ජනතාවගේ ආහාර රටාව වෙනස් වූ ආකාරය
- සෞඛ්‍යය යහපත්ව පවත්වා ගැනීමට ඔබ යෝජනා කරන ආහාර පුරුදු

**(26)**

**දෙවන විකල්පය**

(b)

සම්ප්‍රදාය යනු කිසියම් ජන කණ්ඩායමක් විසින් පොදුවේ පිළිගත් විශ්වාස, ඇදහිලි හා චාරිත්‍ර ආදියයි. තවද, එය පරම්පරාවෙන් පැවැත එන දැනුදු පවත්නා සමාජීය හරයන් හා බැඳුණු අතීත උරුමයකි.

ඉහත සඳහන් වන්නේ සිරිත් විරිත් ගැන ලියැවුණු සිංහල බ්ලොග් සටහනකින් උපුටා ගත් ආරම්භක වාක්‍ය දෙකකි. එහි ලේඛකයා ඔබ යැයි සිතා එම ලියවිල්ල සම්පූර්ණ කරන්න. ඔබේ රචනාවේ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතුය.

- සිරිත් විරිත් හා ඔබේ සමාජය
- උත්සවයකදී ඔබේ පවුලේ අය ඉටු කළ චාරිත්‍ර
- මතු පරපුර වෙනුවෙන් සම්ප්‍රදාය ආරක්ෂා කිරීමේ ඇති වටිනාකම

**(26)**

DO NOT WRITE IN THIS AREA

තෙවන විකල්පය

(c) ඔබ සහභාගී වූ පරිසර සංරක්ෂණ වැඩ සටහනක් පිළිබඳව ජාතික පුවත් පතකට විශේෂාංග ලිපියක් ලියන්න. ඔබේ රචනාවේ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතුය.

- මානව ක්‍රියාකාරකම් හා පරිසරය
- පරිසර දූෂණයේ අහිතකර විපාක
- පරිසරය ආරක්ෂා කර ගැනීමේ ඇති වටිනාකම

(26)

**Indicate which question you are answering by marking a cross ☒ . If you change your mind, put a line through the box ☒ and then indicate your new question with a cross ☒ .**

☒ **Question 6(a)** ☒ **Question 6(b)** ☒ **Question 6(c)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

(Total for Question 6 = 26 marks)

**TOTAL FOR SECTION B = 40 MARKS**



P 6 3 9 5 9 A 0 1 6 2 0

DO NOT WRITE IN THIS AREA

**SECTION C: TRANSLATION INTO SINHALA**

**Write your answer in the space provided.**

**7** පහත සඳහන් ඡේදය සිංහලට නඟන්න.

The climate in the lowlands is typically tropical with an average temperature of 27°C in Colombo. In the higher grounds over 2000 metres altitude the climate can be cooler where the temperature is generally around 16°C. It is well known that there are plenty of bright, sunny and warm days even during the height of the monsoon in the country. Climatically Sri Lanka has no four seasons like in Europe. The south-west monsoon brings rain mainly from May to July to the western, southern and central regions of the island, while the north-east monsoon rains occur in the northern and eastern regions from December to January.

**(20)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**(Total for Question 7 = 20 marks)**

**TOTAL FOR SECTION C = 20 MARKS**
**TOTAL FOR PAPER = 100 MARKS**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

DO NOT WRITE IN THIS AREA

DO NOT WRITE IN THIS AREA

DO NOT WRITE IN THIS AREA

**BLANK PAGE**

BLANK PAGE

**Source information**

**Question 2**
© pixelfusion3d/Getty Images
© ajijchan/Getty Images
© ajijchan/Getty Images

**Question 6**
© Getty Images





DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA